# ටෙලි ගීතය - සිත නොතලා සෙනෙහස දෙන සකි සඳ වේ නම්.....



දෙරණ ටෙලිනාට්‍යයෙන්.....

මල් නොතලා මල්පැණි බොන
බමරුන් වේ නම්
ඒ බමරුන් මල් යායට
ගීයක් අන්දමී........

ගැට නොතලා ඵල වළඳින
සියොතුන් වේ නම්
ඒ සියොතුන් ලිය වදුලට
මල් රූ අන්දමී.......

දළු නොතලා ලිය ගොමුවේ
සාමුව යා නම්
ඒ සාමුව ලිය ගොමුවට
නෑසියෝ අන්දමී......

සිත නොතලා සෙනෙහස දෙන
සකි සඳ වේ නම්
හද මිහිලිය නළවන සකි
මල් වැහි අන්දමී......

ගායනය: නන්දා මාලනී -
පද රචනය :- මහින්ද දිසානායක

මීට දස වසරකට ප්‍රථම විකාශය වූ **දෙරණ නාට්‍ය මාලාව** ප්‍රේක්ෂක හද මනස වැළඳගත් අපූරු ටෙලිනාට්‍ය මාලාවක් විය. 1931 දශකය පාදක කොටගෙන තනන ලද මෙය අගනුවරට නුදුරු සාම්ප්‍රදායික ගම්මානයක පැවති සමාජ හා මානව ජීවිතය පිළිබඳව යථාර්ථය සත්‍ය සිදුවීම් කිහිපයක් පාදක කොට ප්‍රවීන ගත් කතුවර **ඇරැව්වල නන්දිමිත්‍ර** විසින් ලියන ලද තිර පිටපතක් අනුව **නලින් මාපිටිය** විසින් අධ්‍යක්ෂණය කරන ලද්දකි.



සතරසිංහ නම් ගම්මුලාදැනියා සිය නිල බලය යොදා ගනිමින් අසරණ ගම්වැසියන් තලා පෙලයි. ගමපුරා පතල ඔහුගේ සල්ලාල ජීවිතයේ අඳුරු සෙවනැල්ල ඔහු කරාම පැමිණ සිය නිවසේ සාමාජිකයින්ගේ ජීවිත වෙළාගනී. පියාගේ අඩිපාරේ ගමන් කරන තරුණ පුත්‍රයාත්, අධි මානයෙන් මත්ව සිටින වැඩිමල් දියණියත්, ජීවිතයේ කිසිදු සුන්දරත්වයක් හෝ සතුටක් භුක්ති නොවිඳිමින් , අනපේක්ෂිත පවුල් ජීවිත වලට එළඹ සිටිති. මේ සියල්ල දෙස උපේක්ෂාවෙන් බලා සිටිමින් නිරන්තරව පැමිණෙන දුක් කම්කටොළු හා ළතැවුල් විඳ දරා සිටින්නී සතරසිංහ හාමිනේය. මමංකාරයෙන් හා දුෂ්ටත්වයෙන් පිරි ලෝකය හැර දමා ජීවිතයට හිමි සොම්නස සොයන පොඩි දුව වූ විමලාවතී තම පියාගේ පොල් වත්තේ කම්කරුවකු වූ විමලදාස සමග පැන යයි.

මිනිසා කොතරම් බල සම්පන්නව සිටියත්, අනපේක්ෂිතව සිදුවන ජීවන අවස්ථා හේතුකොට ගෙන කවදා හමුත්, තම ඉරණමට මුහුණ දීමට සිදුවන බව ඒත්තු ගන්වා සතරසිංහ රෝගීව ඔත්පල වීම සහ පවුලේ බිඳ වැටීම සිදු වේ. ආදරය , කරුණාව හා මානව දයාව ජීවිතයක් සතුවිය යුතු උත්තම ගුණාංග බව ඉස්මතු කරවමින් නාට්‍ය කරුවා හොඳ හා නරක යන දෙක මත ජීවිතයේ සියල්ල තීන්දු වනු ඇතැයි යන ආගමික සංකල්පය මතු කරයි.
කතා තේමාවට බොහෝ සෙයින් ගැලපෙන අයුරින් නිර්මාණය වී ඇති මෙම ගීතය නිමලාවතීගේ චිත්තාභ්‍යන්තරයෙන් මතු වන මානව ප්‍රේමය හා ඇය තුළ වූ අහිංසක බලාපොරොත්තු කුළුගන්වයි.
ජනකවියේ නොමඳ ආශ්වාදය හා බෞද්ධ පද්‍ය සාහිත්‍යයේ ආභාශය ලබමින් සරළ පද වියමනකින් ලියවී ඇති මෙම ගීතය තුළ ස්වභාවධර්මය හා සාමූහිකව ජීවත් වන ගැමියාගේ නෙතට සමීප වන